සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

**අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024**
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
**Support Test Paper for G.C.E (A/L)**

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 3.10යි |
|---|---|---|---|---|---|---|---|

**( චිත්‍ර කලාව 1 - පැය තුනයි - අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.)**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**විභාග අංකය / නම :-.........................................................................................................**

**උපදෙස්;**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**

- අනු කොටස් **තුනකින්** සමන්විත ය.
- "අ" කොටසින් ප්‍රශ්න **දෙකක්** හා "ආ" සහ "ඉ" යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

- I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

---

**I කොටස**

- **ප්‍රශ්න අංකය 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1. අනුරාධපුර යුගයේ විශිෂ්ට නිර්මාණයක් වූ මහමෙව්නා උයනේ ඇති සමාධි බුදු පිළිමයෙන් පෙන්වන්නේ,

(1) අමරාවතී කලා ලක්ෂණ ය. (2) ගුප්ත කලා ලක්ෂණ ය. (3) පල්ලව කලා ලක්ෂණ ය.
(4) ගාන්ධාර කලා ලක්ෂණ ය. (5) මථුරා කලා ලක්ෂණ ය. (.......)

2. ගම්පොළ යුගයේ දී ඉදි කළ ලංකාතිලක විහාරය කරවන ලද්දේ,

(1) නීලගම පටබැන්දා ය. (2) දේවේන්ද්‍ර මූලාචාරීන් ය. (3) ගණේෂ්වරාචාර්ය ය.
(4) දෙල්මඩ මූලාචාරීන් ය. (5) ස්ථපතිරායර් ය. (.......)

3. විනස් දි මේලෝ ප්‍රතිමාව නිර්මාණය කළ ශිල්පියා වනුයේ,

(1) පීඩියස් ය. (2) මයිරන් ය. (3) ප්‍රැක්සිටෙලස් ය.
(4) ඇලෙක්සැන්ඩ්‍රෝස් ය. (5) ඇන්ටිසෝව් ය. (.......)

4. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර අඩි 17 ක් දිග බයිසන් ගව රුව දක්නට ලැබෙන ගුහාව වනුයේ,

(1) ලැස්කෝ ය. (2) අල්ටමීරා ය (3) චෝවේ ය. (4) ෆොන්ඩි ගෝමී ය. (5) කෝගුල් ය. (.......)

5. කොළඹ රාජකීය විද්‍යාලයේ රංග ශාලාව ඉදිරිපස ඇති අල්ප උන්නත කැටයම නිර්මාණය කළේ,

.(1) ජේ. යුනුස් (2) රිචඩ් ගේබ්‍රියල් ය. (3) තිස්ස රණසිංහ ය. (4) හැරී පීරිස් ය. (5) ඒ.මාර්ක් ය. (.......)

- **ප්‍රශ්න අංකය 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුරු 01 සිට 10 තෙක් අංක කර ඇති පහත සඳහන් ඡායාරූප ඇසුරින් තෝරන්න.**


01


02


03


04


05


06


07


08


09.


10

06. මේවා අතුරින් ගම්පොළ යුගයේ නිර්මිත කුලුනු මොනවාද?

(1) 01,04 (2) 01, 03 (3) 03,04 (4) 04,09 (5) 01,08 (.......)

07 .මේවා අතුරින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන හා සබැඳි කුලුනු වනුයේ කුමක්ද?

(1) 01,03,05,09 (2)01, 03,04,09 (3) 02,03,05,08, (4) 04,05,06,07 (5) 06,07,08,09 (.......)

08. රෝම රජ වරුන්ගේ යුධ ජයග්‍රහණ සැමරීම සිහිපත් කිරීම සඳහා ඉදි කර ඇති කුලුන වනුයේ කුමක් ද?

(1) 02 (2) 03 (3) 04 4) 05 (5) 06 (.......)


09. ඉන්දීයානු කලාව හා සබැඳි නිර්මාණ මොනවාද?

(1) 01,10 (2) 02,09 (3) 06,10 (4) 07,10 (5) 08,07 (.......)


10. ග්‍රීක වාස්තු විද්‍යා නිර්මාණ සඳහා භාවිත කර ඇති කුලුනු වනුයේ මොනවාද?

(1) 02,06 (2) 02,09 (3) 05,10 (4) 06,07 (5) 07,10 (.......)

- ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර **A,B,C,D,E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


A


B.


C.


D.


E

11. A අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,

(1) ඉන්දීය ජන කලා අභාසයෙන් තමාටම ආවේණික ශෛලියකින් ජෙමිනි රෝයි කළ නිර්මාණයකි.
(2) ඉන්දීය ලක්ෂණ නිරූපිත තමාටම ආවේණික ශෛලියකින් කල අම්රිතා ශර්ගිල්ගේ නිර්මාණයකි.
(3) ඉන්දීය අනන්‍යතාවය සහිත නන්දලාල් බෝස්ගේ අගනා කලා නිර්මාණයකි.
(4) අබනීන්ද්‍රනාත් තාගෝර් ඉන්දීය කලා ලක්ෂණ සහ ඝනිකවාදී ලක්ෂණ එක් කරමින් කල සිතුවමකි.
(5) නූතන ඉන්දීය ශිල්පියෙකුගේ ශෛලිගත ලක්ෂණ විදහා දැක්වෙන සිතුවමකි. (.......)

12. B අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,

(1) බෙල්ලන්විල විහාරයේ ඇඳ ඇති මාර පරාජය යි.
(2) යථාර්ථවාදී ශෛලිය ලක්ෂණ සහිත මාර පරාජය යි.
(3) රූප ගොඩනැගීමේ දී ලාලිත්‍යමය ස්වභාවයක් දක්වා ඇති සිතුවමකි.
(4) රිද්මානුකූල රේඛාව හා විසංගත වර්ණ භාවිතයෙන් රූප ගොඩනඟන ලද්දකි.
(5) සෝමබන්දු විද්‍යාපති බෙල්ලන්විල විහාරයේ ඇඳ ඇති මාර පරාජය යි. (.......)

13. C අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳ ඇත්තේ,

(1) වින්සන් වැන්ගෝ ය. (2) ක්ලෝඩ් මොනේ ය. (3) පෝල් සෙසාන්ය.
(4) පෝල් ගොගැන් ය. (5) ජෝර්ජස් බ්‍රාක් ය. (.......)

14. D අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳි ෆ්‍රීඩා කාලෝ යනු,

(1) අධිතාත්විකවාදී ප්‍රවේශයක් සහිත ස්ත්‍රීවාදී පුරෝගාමී ශිල්පිනියකි.
(2) යථාර්ථවාදී ප්‍රවේශයක් සහිත ස්ත්‍රීවාදී ශිල්පිනියකි.
(3) අධිතාත්විකවාදී ප්‍රවේශයක් හා ඝනිකවාදී චිත්‍ර කලා ශෛලියක් අනුගමනය කළ ශිල්පිනියකි.
(4) යථාර්ථවාදී ප්‍රවේශයක් සහිත ව ස්ව ආලේඛ්‍ය චිත්‍ර නිර්මාණය කල ශිල්පිනියකි.
(5) උපස්ථිතිවාදී කලා ප්‍රවේශයක් සහිත ස්ත්‍රීවාදී පුරෝගාමී ශිල්පිනියකි. (.......)

15. E අක්ෂරයෙන් දැක්වෙන "කාඩ් සෙල්ලම් කරන්නෝ" නමැති සිතුවම නිර්මාණය කළ ශිල්පියාගේ වෙනත් සිතුවම් වන්නේ,

(1) දෙවියන්ගේ දිනය හා නිවස සහ ගස් ය. (2) තරුපිරි රැය හා ඇපල් වට්ටිය යි
(3) ඇපල් වට්ටිය හා අර්තාපල් බුදින්නෝ චිත්‍රය යි. (4) ඇපල් වට්ටිය හා ඉරිතැළුණු බිත්තිය සහිත නිවස යි.
(5) ඉරිතැළුණු බිත්තිය සහිත නිවස හා පාදම සහිත මේසය යි. (.........)

- **ප්‍රශ්න අංකය 16 සිට 20 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත නම් කර ඇති මූර්ති ඇසුරින් තෝරන්න.**


F


G.


H.


I.


J

16. F අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) අනුරාධපුර රත්න ප්‍රාසාදයේ ඇති අර්ධ උන්නත කැටයමකි.
(2) පොළොන්නරු වටදාගේ උතුරු දොරටුවේ ඇති සඳකඩ පහණයි.
(3) මහනුවර දළදා මාලිගයේ ඇති කලාත්මක සඳකඩ පහණයි.
(4) තිවංක පිළිම ගෙය ඉදිරිපිට ඇති අල්ප උන්නත කැටයමකි.
(5) බිසෝ මාලිගය අසල දක්නට ලැබෙන සඳකඩ පහණයි. (.......)

17. G. අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) සමබරව දක්වා ඇති නර්තන විලාසයක් දැක්වෙන මූර්තියකි.
(2) ලෝකඩ මාධ්‍යයෙන් පූර්ණ උන්නතව නිර්මාණය කරන ලද මූර්තියකි.
(3) හින්දු ආගමික සංකල්ප සංකේතාත්මකව විහිදා දැක්වෙන මූර්තියකි.
(4) ශිව දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසයක් පෙන්නුම් කරන නටරාජා මූර්තියයි.
(5) පොළොන්නරු ශිව දේවාලයෙන් හමු වූ ලෝකඩ නර්තන මූර්තියයි. (.......)

18. H. අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණයක් වූ සාංචි තොරණ කැටයමකි.
(2) ඉන්දීය මෞර්ය යුගයට අයත් කලාත්මක නිර්මාණයකි.
(3) ජාතක කතා අඛණ්ඩ කථන ක්‍රමයට කර ඇති ගල් පුවරු කැටයමකි.
(4) ඉතා සියුම් හා විස්තරාත්මකව කැටයම් කරන ලද ගල් කැටයමකි.
(5) ඉන්දීය මෞර්ය යුගයේ දී නිර්මාණය කරන ලද අශෝක ස්තම්භ පුවරුවකි. (.......)

19. I. අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) අමරාවතී කැටයම් අතර ඇති නාලාගිරි දමනය නමැති කැටයමයි.
(2) අමරාවතී කැටයම් අතර ඇති සුවිශේෂී නිර්මාණයකි.
(3) බුදුරජාණන් වහන්සේ වෙනුවට සංකේත යොදාගත් අමරාවතී කැටයමකි.
(4) වෘත්තාකාර තලයක් මත නිර්මාණය කරන ලද අලංකාර කැටයම් පුවරුවකි.
(5) ක්‍රියාකාරි සජීවී බවින් යුතු සත්ත්ව රූප සහිත ඡද්දන්ත ජාතකය දැක්වෙන කැටයමකි. (.......)


20. J. අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) ඊජිප්තු අමර්ණ යුගයට අයත් උන්නත ඵලක කැටයමකි.
(2) නාමර් රජුගේ යුධ ජයග්‍රහණයක් දැක්වෙන ඵලක කැටයමයි.
(3) ඊජිප්තු පැරණි රාජධානි යුගයට අයත් අල්ප උන්නත නාමර් ඵලක කැටයමයි.
(4) අත්භූත සත්ත්වයින් දෙදෙනෙක් වටා ගෙතුණු කතා පුවතක් දැක්වෙන ඵලක කැටයමයි.
(5) ඊජිප්තු රාජධානි යුගයට අයත් අලංකාර ඵලක කැටයමකි. (.......)

- අංක **21** සිට **25** තෙක් රූප සටහන් ඇසුරින් නිවැරදි පිළිතුර තෝරන්න.


K.


L.


M.


N.


O

21. K අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) කිරිගරුඬ මාධ්‍යයෙන් කර ඇති පියෙටා ප්‍රතිමාවයි.
(2) මුහුදු සර්පයෙකුගේ ග්‍රහණයෙන් මිදීම ට වෙරදරණ පියෙකු හා පුතුන් දෙදෙනෙකු සහිත ප්‍රතිමාවකි.
(3) යථාර්ථවාදී ශෛලියකට අනුව නිර්මාණය කරන ලද ප්‍රතිමාවකි.
(4) ග්‍රීක හෙලනිස්ටික් යුගයට අයත් ලැඔකූන් ප්‍රතිමාවයි.
(5) රෝමයේ වතිකානු කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ග්‍රීක ප්‍රතිමාවකි. (.......)

22. L අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) රෝම අධිරාජ්‍යයෙකු නිරූපනය කරන සාම්ප්‍රදායික මූර්තියකි.
(2) පරමාදර්ශී පුරුෂ සෞන්දර්යය මූර්තිමත් කරන කැරකැල්ලා මූර්තියයි.
(3) කුරිරු පාලකයෙකුගේ උඩුකය මූර්තියකි.
(4) පුද්ගල චරිතයක් නිරූපනය කරන සාම්ප්‍රදායික රෝම මූර්තියකි.
(5) මානව පරිමාණයෙන් අධි උන්නතව නෙළන ලද කැරකැල්ලා මූර්තියයි. (.......)

23. M අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) ග්‍රීක රෝම ලක්ෂණ සහිත චීවරය හා උෂ්ණීෂය සහිත තක්තිබහිර් ප්‍රතිමාවයි.
(2) භාව ප්‍රකාශනය දුර්වලව යෙදුන හෝර්ට් මන්දාර් ප්‍රදේශයෙන් හමු වූ බුද්ධ ප්‍රතිමාවයි.
(3) මථුරා කලා අභාසය සහිත අලංකාර ප්‍රභා මණ්ලයක් සහිත හිදි බුද්ධ ප්‍රතිමාවකි.
(4) කත්‍රාවලින් හමු වූ වැඩ හිදින බුද්ධ ප්‍රතිමාවයි.
(5) කණිෂ්ක රජු විසින් කරවන ලද ඉන්දීය සම්ප්‍රදායට අනුව නෙළූ බුද්ධ ප්‍රතිමාවයි. (.......)

24. N අක්ෂරයෙන් දැක්වෙන හෙන්රි මුවර්ගේ මෙම නිර්මාණය,

(1) උද්‍යාන මූර්තියක් වශයෙන් නිර්මාණය කරන ලද්දකි.
(2) ශරීර ලක්ෂණ සරලීකරණය කරන ලද මූර්තියකි.
(3) ලෝකඩ මාධ්‍යයෙන් නිම කරන ලද රජ සහ බිසව මූර්තියයි.
(4) අසුනක වාඩි වී සිටින ව්‍යුක්තරූපී පෙම් යුවල මූර්තියයි.
(5) ක්‍රිස්ටල් වර්ගයේ පාෂාණයෙන් සාදන ලද මානව රූ සම්පිණ්නයයි. (.......)

25. O අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) රාජ රාජේශ්වර දේවාලයේ ඇති ශිව දක්ෂිණ මූර්තියයි.
(2) මහා බලිපුරම්වල ඇති ශිව භික්ෂාටන මූර්තියයි.
(3) වෙරළේ දේවාලයේ ඇති ශිව සෝමස්කන්ධ ප්‍රතිමාවයි.
(4) රාජ රාජේශ්වර දේවාලයේ ඇති සුන්දර මූර්ති ස්වාමි ප්‍රතිමාවයි.
(5) මහාමල්ලවපුරම් හි ඇති ශිව දක්ෂිණ මූර්තියයි.

(.......)

- **අංක 26 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

26. පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීමේ දී ,

(1) ආකර්ශනීය දීප්තිමත් වර්ණ මාලාවක් භාවිත කිරීමට වගබලා ගතයුතුයි.
(2) සරල හැඩතල හා සීමිත වර්ණ ප්‍රමාණයක් තෝරාගත යුතුයි.
(3) සන්නිවේදනයේ පහසුව තකා සියලූ ම හැඩතල තාත්විකව ඇඳිය යුතුයි.
(4) සන්නිවේදනයේ ප්‍රබල බවත්, සංකේත භාවිතයත් වැදගත් වෙයි.
(5) වියුක්ත හැඩතල හා සංගත වර්ණ යෙදීම අවශ්‍ය වෙයි.

(.......)

27. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ දී අපේක්ෂා කරනුයේ,

(1) ද්‍රව්‍යවල හැඩ, ත්‍රිමාණ ලක්ෂණ සහිත ව නිරූපණය කිරීමයි.
(2) සිද්ධාන්ත භාවිතයෙන් ද්‍රව්‍යවල ගති ලක්ෂණ නිරූපණය කර තිබීමයි.
(3) ද්‍රව්‍යවල හැඩතල හා ස්වභාවය කල්පිතව හැසිරවීමයි.
(4) ජ්‍යාමිතික ආකෘතියක් මත සමමිතිකව හැඩතල හැසිර වීමයි.
(5) ද්‍රව්‍ය සියල්ල ඇඳ වයනය මතුකර පෙන්වීමයි. (.......)

28. ගෘහ අලංකරණය සඳහා අපතේ යන ද්‍රව්‍ය ඇසුරින් මූර්තියක් නිර්මාණය

කිරීමේ දී සැලකිලිමත් විය යුත්තේ,

(1) අමුද්‍රව්‍යවල ගති ස්වභාවය තේරුම් ගැනීම ය.
(2) අමුද්‍රව්‍යවලට වඩා නිර්මාණයේ අවශ්‍යතාවය ගැන ය.
(3) පර්යාවලෝක මූලධර්ම නිවැරදිව භාවිත කිරීම පිළිබඳව ය.
(4) අමුද්‍රව්‍ය තමාට අභිමත පරිදි යොදා ගැනීම කෙරෙහි ය.
(5) පාරිභෝගික අපේක්ෂාවන් ට අභිමත පරිදි කෘතීන් නිම කිරීමට ය. (.......)

29. සන්නිදර්ශන චිත්‍රයකින් බලාපොරොත්තු වනුයේ,

(1) පොත් පිට කවරයක් අලංකාර ලෙස නිර්මාණය කිරීමයි.
(2) සරල හැඩතල සංකේතාත්මකව යොදා ගනිමින් චිත්‍රයක් නිර්මාණය කිරීමයි.
(3) යම්කිසි ගද්‍ය හෝ පද්‍ය කොටසකින් මතුවන අදහස වඩාත් තීව්‍ර කිරීමයි.
(4) යථාරූපී ශෛලියකින් අදහස් ප්‍රකාශ වන සේ චිත්‍රය ඇඳීමයි.
(5) ආකර්ශනීය බවකින් හා මනා නිමාවකින් අර්ථවත්ව සිතුවම් කිරීමයි. (.......)

30. ව්‍යාප්ත මෝස්තරයක් සැලසුම් කිරීමේදී වඩාත් වැදගත් වනුයේ,

(1) එක් මෝස්තර කොටසක් ඒ හා සමාන තවත් කොටසක් හා සමඟ සම්බන්ධ වන සේ ඇඳීමයි.
(2) තලය පුරා පැතිරී යන සේ කිසියම් ආකෘතියකට අනුව හැඩතල නිර්මාණය කර තිබීමයි.
(3) නිර්මාණශීලී හැඩතල භාවිත කරමින් සිත් ගන්නා ලෙස වර්ණ යෙදීමයි.
(4) සමාන ඒකක ගණනාවක් තලය පුරා විහිදී යන සේ ඇඳීමයි.
(5) යම්කිසි සැරසිලි ඒකකයක් එකම දිශාවකට විහිදීයන ලෙස ඇඳීමයි. (.......)

- **ප්‍රශ්න අංකය 31 සිට 35 තෙක් ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඇසුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න,**

31.මෙම රූපයෙන් දක්වා ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණය වන්නේ,



1) ගල් තලාවක් මත ඉදි කර ඇති මැදිරිගිරිය වටදාගෙයයි.
2) ශ්‍රී ලංකාවේ හමු වූ අලංකාරාත්මක වටදාගෙයයි.
3) තිරියාය ප්‍රදේශයේ ඇති පාෂාණ භාවිතයෙන් කල වටදාගෙයයි.
4) පොළොන්නරු පූජා භූමියෙහි ඇති වැදගත් බෞද්ධ ආගමික ගොඩනැගිල්ලයි.
5) පොළොන්නරු දළඳා මළුවේ පිහිටි අලංකාරාත්මක වටදාගෙයයි.

(.......)

32. මෙහි දැක්වෙනුයේ,



(1) ඇතන්ස් හි සියුස් දෙවියන් වෙනුවෙන් ඉදි කල දේවස්ථානයකි.
(2) ඇතීනා දෙවඟන වෙනුවෙන් ඉදි කරන ලද ඊජිප්තු ආභාසය සහිත දේවස්ථානයකි.
(3) ග්‍රීසියේ විශාලතම වාස්තු විද්‍යා නිර්මාණයයි.
(4) ග්‍රීසියේ විශිෂ්ට ස්මාරකයක් වන පොසිඩන් දෙවොලයි.
(5) ග්‍රීක වාස්තු විද්‍යාවට අභිමානයක් වූ පාතිනොන් දේවස්ථානයයි.

(........)

33. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



(1) මහනුවර යුගයේ ඉදි වූ හින්දු කෝවිලකි.
(2) කලු ගලින් නිර්මිත ද්‍රවිඩ ශිල්පියෙකු විසින් කරන ලද නිර්මාණයකි.
(3) හින්දු වාස්තු ලක්ෂණ පෙන්නුම් කරන විහාර ගෙයකි.
(4) බුවනෙකබාහු රජු විසින් කරන ලද වාස්තු විද්‍යා නිර්මාණයකි.
(5) විජයනගර් ගෘහ නිර්මාණ අනුව කළ ගඩලාදෙණියයි. (........)

34. මෙයින් නිරූපණය වන්නේ,



(1) පල්ලව කලා සම්ප්‍රදායට අනුව කරන ලද නිර්මාණයකි.
(2) පල්ලවයන් විසින් මහා බලිපුරම් වෙරළේ ඉදි කරන ලද කුඩාම දේවාලයයි.
(3) පංච පාණ්ඩව රථ අතර ඇති හුදෙකලාව නෙළා ඇති නකුල සහ දේව රථයයි,
(4) ආකෘතියෙන් අර්ජුන රථය හා සමාන සැරසිලි බහුල ධර්මරාජ රථයයි.
(5) නිමා නොකරන බොකුටු වහලයකින් යුත් භීම රථයයි. (........)

35. මෙහි දැක්වෙන ආරුක්කුව,



(1) රෝමයේ නගර අලංකරණය සඳහා ගොඩනගන ලද්දකි.
(2) කොන්ස්ටන්ටයින් ආරුක්කුව නමින් හඳුන්වයි.
(3) රෝම කැටයම් කලාවේ අභිමානය ලොවට කියා පෑම සඳහා කරන ලද විශිෂ්ට නිර්මාණයකි.
(4) රෝමයේ පළාත් වෙන් කිරීම සඳහා ඉදි කළ ආරුක්කුවකි.
(5) ට්‍රැජන් අධිරාජයාගේ යුධ ජයග්‍රහණ සිහි කිරීම පිණිස කරන ලද අරුක්කුවකි. (.........)

- **ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් දී ඇති රූප සටහන් උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවල ට නිවැරදිම පිළිතුර තෝරන්න.**



36. මෙම සිතුවම දක්නට ලැබෙනුයේ,

(1) දෙගල්දොරුව විහාර බිතුසිතුවම් අතර ය.
(2) මැදවල විහාර සිතුවම් අතර ය.
(3) කතලුව පූර්වාරාම විහාර බිතුසිතුවම් අතර ය.
(4) මුල්ගිරිගල විහාර වියන්තල සිතුවම් අතර ය.
(5) කරගම්පිටිය සුබෝධාරාමයේ පිළිමගෙයි සිතුවම් අතර ය. (.........)

37. මෙම සිතුවම අයත් විහාරය පිහිටා ඇත්තේ,

(1) කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම ප්‍රදේශයේ ය.
(2) කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රදේශයේ ය.
(3) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුල්කිරිගල ප්‍රදේශයේ ය.
(4) මහනුවර දිස්ත්‍රික්කයේ දිගන ප්‍රදේශයේ ය.
(5) ගාල්ල දිස්ත්‍රික්කයේ කතලුව ප්‍රදේශයේ ය (........)

38.මෙම සිතුවමින් දැක්වෙන්නේ,

(1) උරග ජාතක කථා වස්තුවයි. (2) ඇලි ඇතුන් දන්දීමයි. (3) වප් මඟුල අවස්ථාවයි.
(4) සත්තුභක්ත ජාතකයයි. (5) පෙළඹවීම නැමති සිතුවමයි. (.......)

39. මෙම සිතුවම නිර්මාණය කිරීමේ දී ශිල්පියා,

(1) ද්විමාන වර්ණ හා රේඛා සාම්ප්‍රදායික ලක්ෂණ මතුවන ලෙස යොදා ඇත.
(2) සාම්ප්‍රදායික සැරසිලි රටා මෙන්ම බටහිර කලාවේ නව සැරසිලි මූලයන් ද දක්වා ඇත.
(3) අඳුරු වර්ණ හා සියුම් රේඛා යොදාගනිමින් පහතරට සිතුවම් කලා ලක්ෂණ දක්වා ඇත.
(4) මැද මහනුවර කලාවේ ලක්ෂණ විදහා දක්වා ඇත.
(5) ජන කලා සම්ප්‍රදායයන්ගේ ආභාසය ලබමින් සිතුවම අලංකාර කර ඇත. (.......)

40. මෙම සිතුවමේ නිරූපිත අවස්ථාවේ තේමාව වන්නේ,

(1) කෘෂි කර්මාන්තයේ දී සී සෑමේ වැදගත්කමයි.
(2) අධිෂ්ඨානයෙන් තම ජීවන මාර්ගය සකස් කර ගැනීම ය.
(3) කාර්යක්ෂමව තම කාර්යයන්වල නිරතවන පුද්ගලයන්ගේ සාර්ථකත්වයයි.
(4) වප්මඟුල අවස්ථාව හා සිදුහත් කුමරුගේ ප්‍රථම ධ්‍යාන අවස්ථාව දැක්වීමයි.
(5) සංකීර්ණ ආගමික සංකල්පයන් ශ්‍රද්ධාව ඇතිවන පරිද්දෙන් පෙන්වීමයි. (.......)

(ලකුණු 01 X 40=40 යි).

*****

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 13 | |
| විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I | |
| පැය / மணித்தியாலம் / Hours | 3.10යි | |

**( චිත්‍ර කලාව 1 - පැය තුනයි - අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.)**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## "අ" කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**01. කොළඹ යුගයේ චිත්‍ර කලාව ඉතා උසස් කලා ලක්ෂණ පිළිබිඹු කර ඇත.**

(i).ලංකා කලා සංගමයේ ශිල්පීන් **දෙදෙනකු** නම් කරන්න.

(ii).මහනුවර ත්‍රිත්ව දෙවි මැඳුරේ, "යහපත් සමරිතානුවරයා" සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(iii).කැලණි විහාරයේ හා බොරැල්ල ගෝතමී විහාරයේ සිතුවම් පිළිබඳ ආකෘතිය, නිරූපිත සිද්ධි, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතාව පිළිබඳ සංසන්දනාත්මක ඇගයීමක් කරන්න.

**02. ශ්‍රී ලංකාව වූ කලී චිත්‍ර කලාව අතින් අභිමානවත් අතීතයකට උරුමකම් කියන රටකි.**

(i).ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් දක්නට ඇති ස්ථාන **දෙකක්** නම් කරන්න.

(ii).අනුරාධපුර යුගයේ බුදු සිරිත නිරූපිත සිතුවම් ඇති ස්ථාන **දෙකක්** නම් කර, එම සිතුවම් පිළිබඳ කෙටියෙන් පහදන්න.

(iii)සීගිරි චිත්‍ර හා පොළොන්නරු තිවංක පිළිමගෙයි ඇති චිත්‍ර අතර සමාන කම් මෙන් ම අසමානකම් ද දක්නට ලැබේ. එම සිතුවම් පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.

**03. බුදු දහමේ ව්‍යාප්තිය සමඟ පූජණීය ස්ථාන ඇසුරින් බිහි වූ කලා නිර්මාණ හෙළ කලාකරුවාගේ අභිමානය කියාපායි.**

(i).අනුරාධපුර වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් හමු වූ පුවරු කැටයම් **දෙකක්** නම් කරන්න.

(ii).ඉසුරුමුණි කැටයම් කෙරෙහි ඉන්දීය පල්ලව කලා අභාසය ලැබී ඇති බව පිළිගත් මතයයි. කෙටියෙන් පහදන්න.

(iii).පොළොන්නරු ගල් විහාර හිටි ප්‍රතිමාව හා ගඩලාදෙණිය විහාර බුදු පිළිමය අතර දක්නට ලැබෙන ඉරියව්, මාධ්‍ය,භාවිතය, මුද්‍රා හා අභාසය පිළිබඳව තුලනාත්මක විග්‍රහයක් කරන්න.

## "ආ" කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**04.ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කැණීම්වල දී හමු වූ කලා නිර්මාණ හා නගර සැලසුම් තුළින් ගම්‍ය වන්නේ එහි වැසියන් තුළ සෞන්දර්යාවබෝදයක් මෙන් ම මනා සැලසුම් කරණයක් පැවති බවයි.**

(i). ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ **වෙළෙඳ** නගරයක් හා **කාර්මික** නගරයක් නම් කරන්න.

(ii).මොහෙන්ජෝදාරෝ සහ හරප්පා නගරවලින් හමු වූ කලා කෘති ඇසුරෙන් ඔවුන් තුළ වූ සෞන්දර්යාත්මක කුසලතාව පැහැදිලි කරන්න.

(iii).ඉන්දු නිම්න වැසියන් ඉතා දියුණු ක්‍රමවත් නගර සැලසුමක් අනුව කටයුතු කෙරූ බව ඔවුන්ගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් උදාහරණ සහිතව පහදන්න.

**05. 16** වන **සියවසේ ඉන්දියාවේ මුස්ලිම් පාලනය ආරම්භ වීමත් සමග මෝගල් චිත්‍ර කලාව, නව කලා සම්ප්‍රදායක් ලෙස භාරතය පුරා ව්‍යාප්ත වුණි.**

(i).මෝගල් චිත්‍ර කලාවට ආවේණික වූ වස්තු විෂයයන් **දෙකක්** නම් කරන්න.

(ii).“ටජ් මහල් මන්දිරයේ” වාස්තු විද්‍යා ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(iii).මෝගල් කලාවේ බලපෑම ලබා බිහි වූ රාජ්පුට් චිත්‍ර කලාවේ ශෛලිය, ශිල්ප ක්‍රම, මාධ්‍ය භාවිතය හා කලාත්මක ලක්ෂණ පිළිබඳව තෝරාගත් චිත්‍ර නියැදියක් ඇසුරින් ඇගයීමකට ලක් කරන්න.

## "ඉ" කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**06.පුනර්ජීවන යුගයේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාව නව ප්‍රවණතා කරා ගෙන යාමට ගවේශනයේ යෙදුණු ශිල්පීන්ට පසුකාලීනව හැකි වුණි.**

(i) .ලියනාඩෝ ඩාවින්චිගේ චිත්‍ර නිර්මාණ **දෙකක්** නම් කරන්න.

(ii).මයිකල් ආන්ජලෝගේ අවසාන විනිශ්චය චිත්‍රයේ ආකෘතිය හා වර්ණ භාවිතය කෙටියෙන් හඳුන්වන්න.

(iii).පුනරුද කලාව, උපස්ථිතිවාදය හා ඝනිකවාදී කලා නිර්මාණයන්ගේ මූලික ලක්ෂණ වෙන් වෙන් වශයෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**07.නයිල් ගංගා නිම්නය පදනම් කරගෙන ඇරඹි මිසරය, ලෝකයේ පැරණි ශිෂ්ටාචාරවලින් එකක් වන්නාසේම, ගුප්ත වූත්, මායාභුරු වූත්, කලා නිර්මාණ රැසකට උරුමකම් කියන්නක් වේ.**

(i).සාම්ප්‍රදායික ලක්ෂණ පෙන්නුම් කෙරෙන මිසර මූර්ති **දෙකක්** නම් කරන්න.

(ii).අබුසිම්බල් සහ ලුක්සෝර් යන දේවස්තාන වල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii).කුරුලු දඩයම, මිඩම්හි පාත්තයෝ, සහ නාට්‍යාංගනාවෝ යන මිසර සිතුවම් පිළිබඳව කලාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 04 X 15 = 60 යි).

*****

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: III | පැය / மணித்தியாலம் / Hours: 3.10යි |

**(චිත්‍ර කලාව I - පැය තුනයි - අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.)**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## උපදෙස්;

- ඔබේ **විභාග අංකය / නම** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- චිත්‍රය භාර දෙන විට එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.
- ඕනෑම වර්ණ මාධ්‍යයක් හෝ මාධ්‍යය කිහිපයක් මිශ්‍රිත ව භාවිත කළ හැකිය. (දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කිරීමට නිදහස ඇත.)

- පහත සඳහන් **'අ' , 'ආ'** සහ **'ඉ'** කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. රාත්‍රී ආගමික පෙරහැරක්.
2. වැවක දිය නාන වන්දනා පිරිසක් / ගංවතුරට කොටු වූ ගැමි පවුලක්.
3. වනෝද්‍යානයක සිරි නරඹන සංචාරක පිරිසක්.

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

4. සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඇසුරෙන් කුෂන් කවරයකට සුදුසු 9'x9' (අඟල්) ප්‍රමාණයේ විචිත්‍රවත් මුලුතල මෝස්තර නිර්මාණයක්.
5. වියුක්තරූපී ශාක හා පුෂ්ප හැඩතල ඇසුරෙන් චීත්ත රෙද්දක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් 9' x 9' (අඟල්) ප්‍රමාණයේ අවකාශයක් තුළ නිර්මාණය කරන්න. ඔබ ප්‍රිය කරන එක් වර්ණ ප්‍රභේදයක් භාවිතයෙන් වර්ණ කරන්න.
6. ඒක කේන්ද්‍රීයව විහිදී යන පැති අටක් වූ කුඩ රෙද්දක් අලංකාර කිරීම සඳහා ජ්‍යාමිතික හැඩතල ඇසුරින් විසිතුරු මෝස්තරයක් නිර්මාණය කරන්න.

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය**

7. "ළමා පරපුර දැයේ සම්පතයි" යන මැයෙන් විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
8. "පුංචි සිත්තරාවී" නමැති ප්‍රබන්ධිත රස වින්දනාත්මක ග්‍රන්ථයකට සුදුසු පිටකවරයක් ඇඳ වර්ණ කරන්න.(මුල් පිටුව, සනකම, පසුපිට ඇතුළත්විය යුතුය)
9. ශ්‍රී ලංකාවෙන් අපනයන කෙරෙන "බිම්මල්" වර්ගයක් ඇසිරීම සඳහා 8' x 6' (අඟල්) ප්‍රමාණයේ අලංකාර පොලිතින් බෑගයක් සඳහා ලේබලයක් නිර්මාණයක් කරන්න. (සුදුසු නාමයක් හා රූපසටහන් ඇතුළත් කරන්න).

(ලකුණු 01x100=100 යි)

*****



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 13 | |
| විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 3.10යි | |

❖ <u>මෙය විභාග ශාලාධිපතිවරුන් පමණක් පරිහරණය කළ යුතුය.</u>

- **චිත්‍ර I I - වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය.**

නිශ්චල ද්‍රව්‍ය ඇඳීම සඳහා අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වන විට අයදුම්කරුවන්ට නිශ්චල ද්‍රව්‍ය හොඳ හැටි පෙනෙන සේ, අර්ධ කවාකාරව ආසන සකස් කළ යුතුය. එසේ වාඩිකරවණු ලබන අයදුම්කරුවන්,ද්‍රව්‍ය සමූහයට 2 m කට වඩා ළං නොවිය යුතු අතර 4 m කට වඩා ඈත් නොවිය යුතුය. අවශ්‍ය නම් එවැනි කණ්ඩායම් ගණන වැඩි කළ යුතුය.

ද්‍රව්‍ය බලා ඇඳීමේ දී අපේක්ෂකයාට අභිමත පරිදි ඇඳීමට පූර්ණ නිදහස ඇත. ඒ සඳහා කිසියම් අයුරකින් හෝ උපදෙස් දීමෙන් වලකින්න.

- **සකස් කිරීම**

දී ඇති සැලැස්ම අනුව ද්‍රව්‍ය සමූහය සහිත පැළැටිය සකස් කරන්න. මේ සඳහා 73 cm ක් පමණ උස් වූ පැතලි ඩෙස්ක් එකක් භාවිත කරන්න. සුදු බිත්ති තලයක් පසුබිම්ව මෙය සකස් කිරීම වැදගත් ය. එසේ නොමැති විට කළු ලෑල්ලක් පසුබිමේ තබා, සුදු රෙද්දකින් හෝ ආවරණය කර පසුබිම සකස් කරන්න.

- **සැලකිය යුතු ය.**

ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමින් පහතට සිටින සේ සකස් කරන්න. එක් කණ්ඩායමක අයදුම්කරුවන් 15 දෙනෙකුට වඩා වැඩි නොවිය යුතුය. **පෙනී සිටින අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පිළියෙළ කරන්න.**

**පහත සඳහන් රූප සටහන්වල දැක්වෙන ආකාරයට ද්‍රව්‍ය සමූහය සකස් කර ගන්න. ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමෙන් පහළ ධාරකයක් මත තැබිය යුතු අතර, ද්‍රව්‍ය සමූහයේ ඉහළ සීමාව ඇස් මට්ටමේ පිහිටන සේ පිළියෙළ විය යුතු ය.**

- **යෝජිත ද්‍රව්‍ය**

01.**පෙට්ටියක්**
(35 cm x 22 cm x12 cm පමණ ප්‍රමාණයේ හෝ ඊට ආසන් ප්‍රමාණයක ඉවතලන කාඩ්බෝඩ් පෙට්ටියක්, සුදු කඩදාසියකින් ආවරණය කරන්න.)
02.**නැප්කිනයක්**
(වර්ණ ඉරි සහිත 45 cm x 45 cm පමණ ප්‍රමාණයේ)
03.**අඩක් පමණ ඉවත් කල ගස්ලබු ගෙඩියක්**
04.**පළල් දිගු කොළ සහිත ක්‍රෝටන් අත්තක්**
(කොළ 5ක් පමණ වූ)
05.**ප්ලාස්ටික් ජෝග්ගුවක්**(20 cm පමණ උස)
06.**පිඟානක්(නොගැඹුරු)**
07.**වීදුරුවක්**(15 cm පමණ)
08.**අඩිරූලක්**
09.**ධාරකයක්**





(12) WWW.PastPapers.WiKi (12)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!